පවුල් සෞඛ්‍ය කාර්යාංශය
குடும்ப சுகாதார பணியகம்
Family Health Bureau

# DMPA නික්ෂේපනයක් AD (Auto Disable) සිරින්ජරයකින් නිවැරදිව සේවාලාභියෙකුට ලබා දෙන අයුරු




1. DMPA කුප්පියේ අඩියේ මිදී ඇති අවක්ෂේපය සම්පූර්ණයෙන් දිය වන තුරු තදින් සොලවන්න. කුප්පිය අඩියේ සුදු පැහැති කුඩක් ඉතිරි නොවිය යුතුයි.
2. DMPA එන්නත සඳහාම 1ml AD සිරිංජයක් පවුල් සෞඛ්‍ය කාර්යාංශය මගින් සපයනු ලැබේ. DMPA නික්ෂේපණ සඳහා එම සිරින්ජර පමණක් භාවිතා කරන්න.
3. AD සිරින්ජරය කවරයෙන් ඉවතට ගන්න.

**සැලකිය යුතුයි:**

- **පිස්ටනය එන්නත් කටුව දෙසට තල්ලු කිරීමෙන්** <u>**වලකින්න**</u>.
- *එසේ කල හොත් සිරින්ජරය ලොක් වනු ඇත.*




DMPA එන්නත පුරවා ගැනීමට පෙර පිස්ටනය ඉදිරියට තල්ලු කිරීමෙන් වලකින්න




එන්නත් කටුව DMPA කුප්පියේ රබර් පියන තුලට ඇතුළත් කර පිස්ටනය හැකි තාක් පිටුපසට අදින්න




කුප්පියේ ඇති ද්‍රාවණය සියල්ලම සිරින්ජරයට පුරවා ගන්න




වායු බුබුළු නැති වන සේ DMPA සහිත සිරින්ජරය 1ml දක්වා සකසා ගන්න

**එන්නත ලබා දීමේදී:**

1. සේවාලාභියා සුව පහසු ලෙස අසුන් ගන්වන්න.
2. සේවාලාභියාගේ නුහුරු අතේ බාහුවේ උඩ කොටස හොඳින් නිරාවරණය වන සේ ඇඳුම සකසා ගැනීමට උපදෙස් දෙන්න
3. එන්නත් කටුව අංශක 90ක කෝණයකින් සම්පූර්ණයෙන්ම මාංශ පේශිය තුලට ඇතුලත් කරන්න.
4. තත්පර 5-7 කාලයක් තුලදී සෙමින් DMPA ද්‍රාවණය සම්පූර්ණ ප්‍රමාණයම මාංශ පේශිය තුළට ලබා දෙන්න
5. විනාඩි 20 -30 පමණ සේවාලාභියා නිරීක්ෂණය කරන්න.